කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2021

2023 - ඔක්තෝබර්

# BCOME1025 - සූක්ෂම ආර්ථික විද්‍යාව

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි
ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

අ. "ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව යනු ආර්ථිකයේ තනි කොටස්වල හැසිරීම් අධ්‍යයනයයි". ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස භාවිතා කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. පහත සංකල්ප පැහැදිලි කරන්න.

i. නිෂ්පාදනය - හැකියා මායිම

ii ආර්ථික හිඟකම

(ලකුණු 06)

ඇ. i. "රජය නූතන ආර්ථිකයේ වැදගත් අංගයකි". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක මූලික ගැටලු විසඳීම සඳහා වෙළෙඳපොළ යාන්ත්‍රණය ක්‍රියාත්මක වන්නේ කෙසේද?

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 02**

අ. පහත විස්තර නිෂ්පාදන X හා සම්බන්ධ වේ.

ඉල්ලුම සමීකරණය : Qd = 300-3p

සැපයුම් සමීකරණය :Qs = -100+ 2p

ගණනය කරන්න

i. රු. 50 දී ඉල්ලුම් ප්‍රමාණය හා සැපයුම් ප්‍රමාණය

ii සමතුලිත මිල සහ ප්‍රමාණය

(ලකුණු 06)

ආ. i. භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමේ ප්‍රධාන නිර්ණායක මොනවාද?

ii ඉල්ලුමේ වෙනස්වීම ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම.

(ලකුණු 07)

ඇ. i. කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා වන සැපයුම් වක්‍රය දකුණට විතැන්වීමට බලපාන සාධක මොනවාද?

ii "බාල භාණ්ඩයක් සඳහා වන ආදායම් ප්‍රතිවිපාක සෘණ වේ". සාකච්ඡා කරන්න.

(ලකුණු 07)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 03**

අ. i. ඉල්ලුම් නම්‍යතාවයේ කාණ්ඩ පහ ප්‍රස්ථාර ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 05)

ii ඉල්ලුම් නම්‍යතාවය ඉදිරියේ අප සැමවිටම සෘණ ලකුණක් ඇතුල් කරන්නේ ඇයි?

(ලකුණු 05)

ආ. i. භාණ්ඩයක් සඳහා වන ඉල්ලුමේ චාප නම්‍යතාවය සහ ලක්ෂ්‍ය නම්‍යතාවය පිළිබඳ සංකල්ප පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii X භාණ්ඩය සඳහා වන ඇති ඉල්ලුම සලකා බලන්න. මිල රු. 6, දී ඉල්ලුම ප්‍රමාණය ඒකක 30 කි. මිල රුපියල් 8.00 දක්වා වැඩි වී මේ ප්‍රතිඵලයක් ලෙස, භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ප්‍රමාණය ඒකක 20 දක්වා පහත වැටේ යැයි සිතමු. මිල නම්‍යතාවය ගණනය කර ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 04

අ. i. සංඛ්‍යා උපයෝගිතා සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii ක්‍රම සූචක උපයෝගිතා සංකල්පය, ක්‍රම සූචක උපයෝගිතා සංකල්පයෙන් වෙනස් වන්නේ කෙසේද යන්න විස්තර කරන්න.

(ලකුණු 05)

ආ. i. දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් වෙනස් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii උදාහරණ භාවිතා කරමින් සම පිරිවැය වක්‍ර ( iso-costs) සහ සම නිෂ්පාදන වක්‍ර ( iso-quants) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 05

අ. i. කෙටි කාලීන ආන්තික පිරිවැය සහ කෙටි කාලීන සාමාන්‍ය පිරිවැය අතර සම්බන්ධය ප්‍රස්ථාරිකව පැහැදිලි කරන්න..

(ලකුණු 05)

ii Alfa Ltd ආයතනයෙහි පහත විචල්‍ය පිරිවැය ශ්‍රිතය දී ඇත.

$TVC=100Q-20Q^3 + 0.80Q^2$

සමාගමේ ස්ථාවර පිරිවැය රුපියල් 550,000 නම් පහත දෑ සොයා බලන්න:

I. මුළු පිරිවැය ශ්‍රිතය

II. ආන්තික පිරිවැය ශ්‍රිතය

III. සාමාන්‍ය විචල්‍ය පිරිවැය ශ්‍රිතය

(ලකුණු 06)

ආ. i. සමාගමක පරමාර්ථය ලෙස ලාභය උපරිම කිරීමට එරෙහි තර්ක මොනවාද?

(ලකුණු 04)

ii "ආන්තික පිරිවැය ආන්තික ආදායමට සමාන වන අවස්ථාවේදී ලාභය උපරිම වේ.". සාකච්ඡා කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 06**

අ. i. පූර්ණ තරඟය යටතේ සමාගමක, කෙටි කාලීන සහ දිගු කාලීන සමතුලිත අතර වෙනස විස්තර කරන්න.

(ලකුණු 05)

ii " පූර්ණ තරඟකාරි ආයතනයක් යනු මිළ ගණුවෙකි. ". සාකච්ඡා කරන්න

(ලකුණු 05)

ආ. i. "ඒකාධිකාරී තරඟය යනු පූර්ණ තරඟය සහ ඒකාධිකාරය අතර මැද තත්වයයි". සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ii ඒකාධිකාරී ආයතනයක කෙටිකාලීන සමතුලිතතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 07**

අ. i. මිල සහ නිමැවුම් නිර්ණය සම්බන්ධයෙන්, කතිපයාධිකාරි වෙළඳපොලක් ඒකාධිකාරී වෙළඳපොලට වඩා වෙනස් වන්නේ කෙසේද යන්න විස්තර කරන්න.

(ලකුණු 05)

ii ඒකාධිකාරී තරඟය තුළ නිෂ්පාදන විවිධාංගීකරණයේ වැදගත්කම කුමක්ද?

(ලකුණු 05)

ආ. පහත සඳහන් පිරිවැය සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

i.. ප්‍රත්‍යක්ෂ සහ ව්‍යංග පිරිවැය
ii. ආන්තික පිරිවැය සහ සාමාන්‍ය පිරිවැය
iii. හරස් නම්‍යතාවය හා ආදායම් නම්‍යතාවය
iv. පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය

(ලකුණු 10)

(මුළු ලකුණු 20)